සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම
සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

# 2

# "අදිති"

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

● **ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.**

01. ශ්‍රී ලංකාවේ කසළ අර්බුදයට තිරසර විසඳුමක් මේ වන විට අවශ්‍ය වී ඇත. මේ සඳහා විවිධ අංශවලින් සාකච්ඡා කරනු ලැබුව ද ස්ථිර විසඳුමක් මේ වනතුරුත් ගෙන නොමැත. කසළ කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකු බී.බී.සී. සිංහල සේවය වෙත අදහස් දක්වමින් පවසා සිටියේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වන වැදගත් ම මුල් ම අදියර ආරම්භ විය යුත්තේ තම නිවසින් බව යි. ඉවත දමන ආහාර ද්‍රව්‍ය, කාඩ්බෝඩ්, පොලිතීන්, වීදුරු වැනි දේ සෙසු ද්‍රව්‍යවලින් වෙන් කර තැබීම පළමු ව කළ යුතු බවත් මුළුතැන්ගෙයි ඉතුරු වන පිසූ ආහාර සහ නොපිසූ ආහාර කොම්පෝස්ට් බඳුන්වල දැමිය යුතු බවත් <u>ඔහු පවසයි.</u>

i. මෙහි සඳහන් ශ්‍රී ලංකාවේ ඇති අර්බුදය කුමක් ද ? ........................................................................

ii. කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වන වැදගත් ම මුල් ම අදියර ආරම්භ විය යුත්තේ

කොහෙන් ද ? ........................................................................................................................

iii. මුළුතැන්ගෙයි ඉතුරු වන පිසූ ආහාර සහ නොපිසූ ආහාර දැමිය යුත්තේ කොහේ ද ?

........................................................................................................................................

iv. ඡේදයේ ඉරි ඇඳි වාක්‍ය අතීතකාල වාක්‍යයක් ලෙස ලියන්න. ....................................................

v. අදහස් දැක් වූ තැනැත්තා කෙබඳු අයෙක් ද ? ...........................................................................

........................................................................................................................................

vi. ප්‍රාණවාචී ඒකවචන වර්තමානකාල ක්‍රියා පදයක් ලියන්න. ......................................................

02. පහත වාක්‍යවලට ගැළපෙන අතීතකාල ආඛ්‍යාත පද තෝරා ලියන්න.

| |
|---|
| හැදුවෙමු / රැක්කේ ය / සාදති / සැනසුවා ය / සෑදුවෝ ය |

i. ළමයි එකතු වී සෙල්ලම් ගෙයක් ..............................................................

ii. මිතුරිය නිතරම අපව ...........................................................................

iii. තාත්තා හේනේ පැල් ..........................................................................

03. දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් සාදන්න.

| |
|---|
| බින්දුලා /අන්තේ /ගියා /නිවාඩුවට /සති /ගමේ |

........................................................................................................................................

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

i. ශිෂ්‍යත්වය / පුස්ථකාලය / නිර්මානය

ii. ගැහැණු / ශ්‍රමදානය / වර්ශය

05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

★ ඇයගේ කැපවීම පුදුමාකාර ය

06. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

i. පරංගියා ....................................... ගියා වගේ.

07. ගැළපෙන යුගල පදය තෝරා ලියන්න. ( **විහිළු තහළු /අරුම පුදුම /ගෙවල් දොරවල්** )

i. මේ කාලයේ ....................................................... දේවල් අසන්නට ලැබේ.


ii. මිතුරන් සමග ....................................................... කරමින් කටයුතු කරන්න.

08. පහත වාක්‍ය නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් x ලකුණ ද යොදන්න.

i. රාත්‍රී අහසේ සඳ පෑයුවා ය.. (.........)

ii. ගංගා මුහුදට ගලා බැස්සේ ය. (.........)

09. මෙම රූපවල නම් ඉංග්‍රීසියෙන් ලියන්න.


i.  ................................

ii.  ...................................

iii. මෙහි සිංහල අදහස ලියන්න. Come here

.........................................................................................................

10. දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

i.  ................................

ii. 11 ...................................

iii. **නූලහම් අංගේ** යන්නෙහි සිංහල තේරුම ලියන්න.


.....................................................................................................................................

● **පිළිතුරු සපයන්න.**

11. 10 017හි සංඛ්‍යා නාමය ලියන්න. ......................................................................................

12. සංඛ්‍යා රටාවේ ඊළඟ හිස්තැන් දෙකට ගැළපෙන සංඛ්‍යා ලියන්න. 187, 191, 195, .......... , .........

● A භාජනයට, B භාජනයට මෙන් තෙගුණයක් ජලය පිරවිය හැකිය.




13. B භාජනයේ ධාරිතාව 500ml නම් A ප්‍රමාණයේ භාජනයකට පිරවිය හැකි දියර ප්‍රමාණය කොපමණ ද ? ..........................

14. පස්වරු 4.45 ට ආරම්භවීමට තිබුණු උත්සවයක් නියමිත වේලාවට වඩා මිනිත්තු 45ක් ප්‍රමාද වී ආරම්භ වූ අතර උත්සවයට හරියට ම පැය 1ක් ගත විය. එම උත්සවය අවසන් කළ වේලාව කීය ද ? ....................................................................................................................

15. එක්තරා පොල් වත්තකින් මාර්තු මාසයේ දී පොල් ගෙඩි 4984ක් කඩන ලදි. එහෙත් හොරු කැඩීම නිසා අප්‍රේල් මාසයේ දී එය 1279 දක්වා පහත වැටුණි. ඒ අනුව මෙම පොල් වත්තෙන් එම මාස දෙකේ දී ම කඩන ලද මුළු පොල් ගෙඩි ගණන කීය ද ? ...............................................

● කුඩා බත් කඩයක විකිණීමට තිබුණු විවිධ බත් පාර්සල් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| වර්ගය | පාර්සල් ගණන |
|---|---|
| එළවළු පමණක් ඇති | 22 |
| එළවළු සමග මාළු ඇති | 16 |
| එළවළු සමග මස් ඇති | 31 |

16. එළවළු පමණක් ඇති බත් පාර්සලයක් රු. 200.00 බැගින් පාර්සල් 6ක් විකිණීමෙන් ලැබෙන ආදායම කොපමණ ද ? රු. ...........................................................................

17. එළවළු සමග මස් ඇති බත් පාර්සලයක් විකිණීමෙන් රුපියල් 100ක ලාභයක් ලැබේ නම් එම පාර්සල් සියල්ල විකිණීමෙන් ලැබෙන ලාභය රුපියල් කීය ද ? ...................................................

● නගර අතර දුර සටහනක් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| | | | A | |
| | | B | 12 | |
| | C | 23 | 35 | |
| D | 30 | ....... | 88 | km |

18. B සිට D නගරයට දුර කොපමණ ද ?

.......................................................................

19. A සිට B,C හරහා D නගරය වෙත ගමන් කරන්නෙක් A සිට B දක්වා පැමිණ ඇත. ගමන අවසන් කිරීමට ඔහුට තව කොපමණ දුරක් යාමට තිබේ ද ? ..................................................................

20. උත්සව සමය වෙනුවෙන් සෑම පැණිබීම ලීටරයේ බෝතලයක් සඳහා ම මිලිලීටර 55ක් වැඩිපුර ලැබේ. මෙම බෝතල් 4ක වැඩිපුර ඇති බීම ප්‍රමාණය කොපමණ ද ? ..............................ml


21. තේ කුඩු 2kg ක ප්‍රමාණයකින් 100g පැකට් කීයක් සාදා ගත හැකි ද ? ............................

22. 

රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.......................................................................

23. චතුමිණි සහ දිනුම් චාරිකාවකට සහභාගී වී නිවසට පැමිණි වේලාව 18:00 බව චාරිකා වාර්තාවක ලියා තිබුණි. එම වේලාව මෙම සාමාන්‍ය ඔරලෝසු මුහුණතේ අඳින්න.




24. රෝගයකින් ආරක්ෂාවීම සඳහා ගෙනැවිත් තිබූ එන්නත් ගණන 44 000කි. ඉන් 12 494ක් ජනතාවට ලබා දී අවසන් වූයේ නම් ඉතිරි එන්නත් ගණන කීය ද ? ......................................

25. ක්‍රිකට් තරගයක දී කණ්ඩායමක් ලකුණු 102ක් ලබාගත් අතර එම කණ්ඩායමේ මිනද එම ලකුණු වලින් $\frac{1}{3}$ ක් තනිව ම ලබාගත්තේ නම් ඔහු ලබා ගත් ලකුණු ගණන කීය ද ? ............................

26. අසරණ අයෙකුට නිවසක් තැනීම සඳහා ආධාර එකතු කළ සිතුම් රු.1540ක් ද සෙනුල් රු.5555ක් ද ඔනිත රු.6520ක් ද එකතු කර තිබුණි. තිදෙනා ම එකතු කර ඇති මුළු මුදල කීය ද ? .....................................

27. භානුජා නිවසේ තිබුණු පොල්තෙල් 2l 400ml ප්‍රමාණයෙන් 1l 50ml ක ප්‍රමාණයක් දන්සලකට පරිත්‍යාග කළා ය. ඉතිරි පොල්තෙල් ප්‍රමාණය කොපමණ ද ? ......................................

28. සමචතුරස්‍ර සහ ඍජුකෝණාස්‍ර හැඩ යම් ගණනක් යොදාගෙන ඝනකාභයක් සාදා ඇත. එහි ඇති සමචතුරස්‍ර හැඩ ගණන කීය ද ? ......................................................

29. එක් පේළියක 8 බැගින් ශාලාවක පුටු තබා ඇත. සිසුන් 168 දෙනෙකුට වාඩිවීමට පුටු පේළි කීයක් අවශ්‍ය ද ? ............................................................

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

30. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ 2වන අවස්ථාව වනුයේ

    i. උද්‍යානය ii. ප්‍රාර්ථනාව iii. මානසික ලිහිල් බව

31. ආහාර වර්ග සකස් කිරීමේ දී ස්වභාවික කහ කුඩු භාවිත කරන්නේ

    i. වර්ණකයක් ලෙස ii. විෂ නාශකයක් ලෙස iii. මේ දෙකට ම

32. මේ අතරින් කුරි (හංවඩු) ගසනු ලබන සත්වයා තෝරන්න

    i. කුකුළා ii. ඌරා iii. ගොනා

33. පෙරවරු 9.30ට පමණ දේදුන්නක් පායා තිබුණි. ඒ කුමන දිශාවේ ද ?

    i. නැගෙනහිර ii. දකුණ iii. බස්නාහිර

34. පනාමල් සෑදෙන ශාකය තෝරන්න

    i. එළබටු ii. කොස් iii. දෙල්

35. රාජ්‍ය ආයතන පිළිබඳව තොරතුරු ලබා ගත හැකි කෙටි දුරකථන අංකය

    i. 1919 ii. 1990 iii. 1926

36. "පාවිච්චියට පෙර හොඳින් සොලවන්න" යනුවෙන් සඳහන් වනුයේ

    i. කිරි තේ ii. බෙහෙත් දියර iii. මුදවපු කිරි

37. මෙම මල් අතරින් ඉක්මනින් ම පරනොවන මල වනුයේ

    i. බෝගන්විලා ii. කඩුපුල් iii. රෝස

38. විනීත රියදුරෙකු හඳුනාගත හැකි ලක්ෂණයකි

    i. පැදවීමට පෙර රථයට වඳියි ii. පිළිවෙළට ඇඳුම් අඳියි iii. මාර්ග නීති පිළිපදියි

39. දැව ලෑලි ලබාගත හැකි ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න

i. බුරුත, තේක්ක, කොහොඹ

ii. කොස්, කොහොඹ, කෙසෙල්

iii. බුරුත, කුඹුක්, දෙල්

40. ශ්‍රී ලංකාව වෙනුවෙන් දෙවන ඔලිම්පික් ක්‍රීඩා පදක්කම දිනාගත් ශ්‍රී ලාංකිකයා වනුයේ

i. ආතර් සී ක්ලාක්    ii. සුසන්තිකා ජයසිංහ    iii. ඩන්කන් වයිට්

41. පලතුරක් ලෙස වැලගෙඩිය ලබාගන්නේ

i. පොල් ගසෙනි    ii. කොස් ගසෙනි    iii. අඹ ගසෙනි

42. සන්නිවේදන මාධ්‍ය පමණක් අඩංගු පිළිතුර වනුයේ

i. දුම්රිය, බසය    ii. ගුවන්විදුලිය, දුම්රිය    iii. රූපවාහිනිය, ලිපිය

43. සජීවී ලෙස තොරතුරු ලබාදිය හැකි මාධ්‍යයකි

i. චිත්‍රපට    ii. අත් පත්‍රිකා    iii. රූපවාහිනිය

44. අම්පාර දිස්ත්‍රික්කය අයත් වන පළාත වනුයේ

i. නැගෙනහිර පළාත    ii. මධ්‍යම පළාත    iii. වයඹ පළාත


45. රස පහක් ඇතැයි සඳහන්වෙන පලතුර තෝරන්න


i. දූරියන්    ii. ගඩු ගුඩා    iii. බෙහෙත් නෙල්ලි


46. මේදය වැඩිපුර ඇති ආහාර වර්ග කෑමට ගැනීමෙන් අපට සිදු නොවන දෙයකි

i. තරබාරුවීම    ii. දීර්ඝායුෂ ලැබීම    iii. රුධිරනාල අවහිරතා ඇතිවීම

47. සුළඟින් ව්‍යාප්තවන බීජය තෝරන්න

i. 

ii. 

iii. 

48. ලොව කුඩා ම පක්ෂියා ලෙස සැලකෙන සත්ත්වයා

i. හමිංබර්ඩ් පැණි කුරුල්ලා    ii. බත් කූරා    iii. පැස්බරා

49. අපට ප්‍රෝටීන් බහුලව ලැබෙන ආහාරයකි

i. සෝයා බෝංචි    ii. පොල්    iii. බඩ ඉරිඟු

50. පොල්තෙල් මිදීමට හේතුව වනුයේ

i. නොසෙල්වෙන සේ තිබීම    ii. පරිසරය සිසිල් වීම    iii. රත්වීම

51. ශිවරාත්‍රී උත්සවය සමරනු ලබන ආගමිකයින් වන්නේ

i. දෙමළ　　ii. කතෝලික　　iii. හින්දු

52. එකම සතාගේ ජීවන චක්‍රයේ අවස්ථාවක් සඳහන් නොවන පිළිතුර තෝරන්න

i. කණාමැදිරියා　　ii. රෑබදුල්ලා　　iii. ඉස්ගෙඩියා

53. වාහනයක තිරිංග ලාම්පුවල පාට තෝරන්න

i. සුදු　　ii. කහ　　iii. රතු

54. බීජ දක්නට නොලැබෙන එළවළුවකි

i. උක්　　ii. පුහුල්　　iii. දෙල්

55. ජලවාෂ්ප ප්‍රයෝජනයට නොගෙන සකස් කර ගන්නා ආහාරය වනුයේ

i. පිට්ටු　　ii. පැටිස්　　iii. හැලප

56. තම පැටවා කටින් එල්ලාගෙන යන්නේ

i. පූසා　　ii. මකුළුවා　　iii. කැන්ගරුවා

57. පිරිසිදු ජලයේ ලක්ෂණයක් නොවන්නේ

i. පාටක් ඇත　　ii. හැඩයක් නැත　　iii. ගඳක් හෝ සුවඳක් නැත

58. කඩා වැටෙන තරු ලෙස අප දකින්නේ

i. වල්ගා තරු　　ii. උල්කාපාත　　iii. ග්‍රහලෝක

59. උතුරු දුම්රිය මාර්ගයේ අවසන් දුම්රිය ස්ථානය

i. ත්‍රිකුණාමලය　　ii. කන්කසන්තුරේ　　iii. මඩකලපුව

60. **සතුන්ගෙන් අපට ඉගෙනගත හැකි පාඩම්** යන මාතෘකාවට අදාල ව උක්ත ආඛ්‍යාත නිවැරදි අර්ථවත් වැකි 3ක් ලියන්න. සෑම වාක්‍යයක් ම වචන හතරකට වඩා වැඩි විය යුතුය.

i. ................................................................................................................................

................................................................................................................................

ii. ................................................................................................................................

................................................................................................................................

iii. ................................................................................................................................

................................................................................................................................

(නිවැරදි අත් අකුරු සහ ඉලක්කම් සඳහා ලකුණු - 1 )